# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/03/2025 (PSC)**

එස්.එම්.ඒ.කේ.සේනානායක
**අභියාචක**
**එදිරිව,**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය : 2025.10.16**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක එම්.කරපුටුගල මහතා
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් එම්.චන්ද්‍රිකා මලවිආරච්චි මහත්මිය

**-නියෝගය-**

අභියාචක වන එස්.එම්.ඒ.කේ.සේනානායක විසින් මෙම විනිශ්චය අධිකාරය වෙත 2025.01.02 ඉදිරිපත් කරන ලද අභියාචනා පෙත්සමෙන් ඉල්ලා ඇත්තේ, ඔහුව සේවයෙන් පහ කරමින් ලබා දී ඇති නියෝගය ඉවත් කර ඔහුව නැවත සේවයේ පිහිටුවන ලෙසත්, සේවයේ නොසිටි කාලපරිච්ඡේදය තුළ ඔහුට ගෙවිය යුතුව තිබූ හිඟ වැටුප් ගෙවීම සඳහා නියෝගයක් නිකුත් කරන ලෙසත්ය. අභියාචක විසින් මෙම අභියාචනය ඉදිරිපත් කර ඇත්තේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2024.12.19 දිනැති ලිපිය මඟින් කරන ලද නියෝගය හේතුවෙනි. එකී කොමිෂන් සභාව එම නියෝගය නිකුත් කර ඇත්තේ 2024.05.06 දින ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද විනය නියෝගයට එරෙහිව, අභියාචක විසින් ඉදිරිපත් කර තිබූ අභියාචනයක් සලකා බැලීමෙන් අනතුරුවයි.

අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා හයකට ඔහුව වැරදිකරු කරමින් ඉහත කී විනය නියෝගය නිකුත් කර ඇත. විධිමත් විනය පරීක්‍ෂණය පැවැත්වූ නිළධාරියා විසින් අභියාචක වෙත ඉදිරිපත් කර තිබූ චෝදනා හයෙන් චෝදනා හතරකට (අංක III,IV,V සහVI යන චෝදනාවන්ට) පමණක් ඔහුව වැරදිකරු කර තිබූ අතර ඉතිරි චෝදනා දෙකෙන් ඔහුව නිදහස් කර ඇත.

කෙසේ වෙතත් ආයතන සංග්‍රහයේ II වන වෙළුමේ, XLVIII වන කාණ්ඩයේ, 22:7 වගන්තිය යටතේ විනයි බලධාරියාට ලැබී ඇති බලතල ප්‍රකාරව මෙහිදී සළකා බැලිය යුතු වන්නේ විනය පරීක්‍ෂණයේදී අභියාචක වැරදිකරු බවට පත් කරමින් ගෙන ඇති තීරණයේ නිරවද්‍යතාවයයි.

විනය පරීක්‍ෂණ පැවැත් වූ නිළධාරියාගේ තීරණවලින් බැහැරව ගොස් එකී නිදහස් කරන ලද චෝදනා වලින්ද වැරදිකරු කරමින් ගෙන ඇති තීරණය ඇතුළු විනය බළධාරියාගේ නිගමනයන්හි ඇති නිරවද්‍යතාවය සළකා බැලීය යුතුය. ඒ අනුව අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා මොනවාද යන්න සළකා බැලීමයි. එකී චෝදනා පහත දැක්වේ.

I. **ඔබ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරයෙකු වශයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ තලාතුඔය ගොවිජන සේවා මධ්‍යස්ථානයට අනුයුක්තව සේවය කරමින් සිටියදී ගොවි විශ්‍රාම වැටුප් දායක මුදල් ලෙස රු.81450/- ක් හෝ ඊට ආසන්න මුදලක් ආර්.එම්.බණ්ඩාරමැණිකේ යන අයගෙන් ලබා ගැනීමෙන් හා එසේ ලබාගෙන ඇයව ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක නොකිරීමෙන් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ පළමු උපලේඛණයේ සඳහන් අංක 7 වගන්තිය උල්ලංඝණය කිරීමෙන් වරදක් සිදු කිරීම.**

II. **ඔබ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරයෙකු වශයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ තලාතුඔය ගොවිජන සේවා මධ්‍යස්ථානයට අනුයුක්තව සේවය කරමින් සිටියදී ගොවි විශ්‍රාම වැටුප් දායක**

මුදල් ලෙස රු.9800/-ක් හෝ ඊට ආසන්න මුදලක් බී.එම්.එම්.ජී.ටිකිරි බණ්ඩා යන අයගෙන් ලබාගෙන ඔහුව ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක නොකිරීමෙන් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ පළමු උපලේඛණයේ සඳහන් අංක 7 වගන්තිය උල්ලංඝණය කිරීමෙන් වරදක් සිදු කිරීම.

III. ඔබ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරයෙකු වශයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ තලාතුඔය ගොවිජන සේවා මධ්‍යස්ථානයට අනුයුක්තව සේවය කරමින් සිටියදී ආර්.එම්.බණ්ඩාරමැණිකේ යන අයගෙන් හා බී.එම්.එම්.ජී.ටිකිරි බණ්ඩා යන අයගෙන් ගොවි විශ්‍රාම වැටුප් මුදල් ලබා ගෙන එම මුදල් සඳහා එම පුද්ගලයන් වෙත පොදු මුදල් කුවිතාන්සි නිකුත් නොකිරීමෙන් වරදක් සිදු කිරීම.

IV. ඔබ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරයකු වශයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ තලාතුඔය ගොවිජන සේවා මධ්‍යස්ථානයට අනුයුක්තව සේවය කරමින් සිටියදී තම තනතුර භාවිත කර මහජන මුදල් එකතු කිරීමෙන් හා එසේ එකතු කරගත් මුදල් අයථා ලෙස පරිහරණය කිරීමෙන් වරදක් සිදු කිරීම.

V. ඔබ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරයකු වහයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ තලාතුඔය ගොවිජන සේවා මධ්‍යස්ථානයට අනුයුක්තව සේවය කරමින් සිටියදී ගොවි විශ්‍රාම වැටුප් දායක මුදල් අයථා ලෙස පරිහරණය කිරීම තුළින් ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි,

**දෙපාර්තමේන්තු චක්‍රලේඛ උපදෙස් උල්ලංඝණය කිරීම හෝ හිතාමතා හෝ අනවධානයෙන් හෝ නොසලකා හැරීම තුළින් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ පළමු උපලේඛණයේ සඳහන් අංක 15 වගන්තිය උල්ලංගනය කිරීමෙන් වරදක් සිදු කිරීම.**

**VI. ඉහත අංක I සිට V දක්වා චෝදනාවල සඳහන් වැරදි එකක් හෝ ඉන් කිහිපයක් හෝ සියල්ලම හෝ සිදු කිරීම හේතුකොට ගෙන රාජ්‍ය සේවයත් පොදුවේ ඔබ දරණ තනතුරක් අපකීර්තියට පත් කිරීම.**

ඉහත කී චෝදනාවන්හි සඳහන්, බණ්ඩාර මැණිකේ යන අය විධිමත් විනය පරීක්ෂණයේදී සාක්ෂි දී ඇත. ඇය සාක්ෂි දෙමින් පවසා ඇත්තේ වරින් වර රුපියල් 700 බැගින් වූ මුදල් අභියාචක වෙත ලබා දුන් බවයි. එසේ මුදල් ලබා දී ඇත්තේ ඉහත කී සාක්ෂිකාරියට ගොවි විශ්‍රාම වැටුප් ලබා ගැනීම සඳහා වන අරමුණින්ය. ඉහත කී සාක්ෂිකාරිය පරීක්ෂණ නිළධාරියා විසින් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් පවසා ඇත්තේ, විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙව්වේ මාගේ ඉදිරි ජීවිත කාලයේ විශ්‍රාම වැටුපක් ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් බවයි. ඇයගේ එම බලාපොරොත්තුව ඉෂ්ඨ නොවූ බවත් කෙසේ නමුත් ආරවුල සමථයකට පත් වීමේදි රු. 80,000 ක මුදලක් අභියාචක විසින් ඇයට ලබා දුන් බවටත් ඇය පවසා ඇත.

එම සාක්ෂිකාරියගෙන් හරස් ප්‍රශ්න ඇසීමට අභියාචකට අවස්ථාව ලබා දී තිබූ අතර, අභියාචක ඉහත කී සාක්ෂිය සම්බන්ධයෙන් කිසිඳු හරස් ප්‍රශ්නයක් අසා නැත. එයින්ම පෙනී යන්නේ ඉහත කී සාක්ෂි කිසිඳු ආකාරයකට බිඳ වැටීමක් සිදු වී නොමැති බවයි. ඒ අනුව එම සාක්ෂිය පිළිගැනීම හැර වෙනත් විකල්පයක් නැත. එම සාක්ෂිකාරියට අමතරව මුදල් ලබා දුන්නා යැයි කියනු ලබන ටිකිරි බණ්ඩාගේ බිරිඳ වන නන්දාවතී යන අයද සාක්ෂි දී ඇත. ඇය මෙම අභියාචනය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් අභියාචක වෙත මුදල් ලබා දුන් බව පවසා ඇත. එකී සාක්ෂි කිසිවක් බිඳ හෙලා නැත.

තවද අභියාචක විසින් රු. 112,250 ක මුදලක් ආර්.එම්.බණ්ඩාර මැණිකේ, එච්.එම්.හීන්මැණිකේ, සහ ඩී.එච්. ටිකිරි බණ්ඩා යන අයට ආපසු ගෙවා ඇත. එසේ මුදල් ගෙවූ ගෙවන අවස්ථාවේදී, ඒ බව සනාථ කරමින් 2017.02.23 දිනැති ලිපිය ලබා දී ඇත. එම ලිපියෙහි අභියාචක ඔහුගේ අත්සන තබා ඇත. එකී ලිපියේ පළවන වාක්‍යයේම සඳහන් කර ඇත්තේ  අභියාචක විසින් කෘෂි රක්‍ෂණ මුදල් ගොවීන්ට ලබා දීමේදී ඔහු විසින් සිදු කරන ලද මුදල් අවභාවිතාව සම්බන්ධයෙන් වරද පිළි ගන්නා බවයි. එවැනි තත්ත්වයක් යටතේ පැහැදිළිව පෙනී යන්නේ, අභියාචක මෙම චෝදනාවන්ට වරද පිළි ගෙන ඇති බවයි.

ඉහත කී සාක්ෂි සළකා බැලීමේදී පැහැදිළිව පෙනී යන්නේ අභියාචක ඉදිරිපත් කර තිබූ චෝදනා වලට වරදකරු කරමින් නිකුත් කර ඇති විනය නියෝගයේ දෝෂයක් නොමැති බවයි. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනය ප්‍රතික්ෂේප කිරීමෙහිද වරදක් පෙනෙන්නට නැත. ඉහත කරුණු සලකා බලා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සම නිශ්ප්‍රභා කරමු.

අභියාචනය නිශ්ප්‍රභා කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/-